

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ත්‍රිකුණාමලය
மாவட்டச் செயலகம், திருகோணமலை

District Secretariat, Kachcheri, Trincomalee

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳව කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු ආයතනභාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்றத்தின் அரச கணக்குக்குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பான நிலையுயற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கொளரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Submission of the observations of Hon. Minister in charge of the institution and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119 (4)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 79
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ත්‍රිකුණාමලය

පළමු කොටස

	රජයේ ගිණුම් පිළිබඳ කමිටුව විසින් පෙන්වා දෙන ලද අඩුපාඩු	**රජයේ ගිණුම් පිළිබඳ කමිටුව විසින් පෙන්වා දෙන ලද අඩුපාඩු නිවැරදි කිරීම සඳහා ආයතනය විසින් ගත් ක්‍රියාමාර්ගය හා වර්තමාන ප්‍රගතිය**
01	අනවසර ඉඩම් අල්ලා ගැනීම් පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත	අනවසර ඉඩම් අල්ලා ගැනීම් පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යාම ප්‍රාදේශීය ලේකම් කාර්යාල විෂය පථයට අයත්වන වන අතර ඔවුන් විසින්ම එය කළමනාකරණය කරනු ලබයි. දිස්ත්‍රික් ඉඩම්පරිහරණ සැලසුම් කමිටු රැස්වීමේ දී හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ප්‍රගති සමාලෝචන රැස්වීම්වලදී ගණන්දීමේ නිලධාරී විසින් මෙම ලේඛන පරීක්ෂා කරනු ලැබේ. මේ වන විට සියළු ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් අනවසර ඉඩම් අල්ලා ගැනීම් පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යයි.
02	දීර්ඝ කාලීන බලපත්‍ර නිකුත් කිරීමේ ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත	දීර්ඝ කාලීන බලපත්‍ර නිකුත් කිරීමේ ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යාම ප්‍රාදේශීය ලේකම් කාර්යාල විෂය පථයට අයත්වන එකක් වන අතරම ඔවුන් විසින්ම එය කළමනාකරණය කරනු ලබයි. දිස්ත්‍රික් ඉඩම්පරිහරණ සැලසුම් කමිටු රැස්වීමේ දී හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ප්‍රගති සමාලෝචන රැස්වීම්වලදී ගණන්දීමේ නිලධාරී විසින් මෙම ලේඛන පරීක්ෂා කරනු ලැබේ. මේ වන විට සියළු ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් දීර්ඝ කාලීන බලපත්‍ර නිකුත් කිරීමේ ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යනු ලැබේ.
03	අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත	අවදානම් ලේඛනය පවත්වාගෙන යාම දිස්ත්‍රික් ආපදා කළමනාකරන මධ්‍යස්ථානය විසින් නිරන්තර ඇගයීම් අනුව සිදුකරගෙන යනු ලබන අතර දිස්ත්‍රික් ලේකම් විසින් එය අධීක්ෂණය කරනු ලබයි. දිස්ත්‍රික් ආපදා කළමනාකරන මධ්‍යස්ථානය විසින් අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යනු ලැබේ.
04	විගණනකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් ඇතුලත පිළිතුරු සපයා නොතිබුණි.	එකඟවෙමි. ඉඩම් සම්බන්ධ විගණන විමසුම් කීපයක් සඳහා පිළිතුරු සකස් කිරීමට සෑහෙන කාලයක් ගතවීම නිසා ප්‍රමාදයක් සිදුව ඇත. එසේ වුවද හැකි කඩිනමින්ම පිළිතුරු ඉදිරිපත් කර ඇති බව කාරුණිකව දන්වමි. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වලදී මසක් ඇතුළත පිළිතුරු ඉදිරිපත් කරන ලෙස ප්‍රාදේශීය ලේකම්වරු දැනුවත් කර ඇත.
05	2020.08.28 දිනැති අංක 01/2020 දරන රාජය මුදල් චක්‍ර ලේඛයේ පළමු කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාල රාමුව ඇතුළත මු.රෙ.756 (6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත	එකඟ වෙමි. සියළු වාර්තා ලබා දී තිබුණ ද නියමිත කාලරාමුව තුළ පිළිතුරු ලබා දීමේ ප්‍රමාදයක් සිදුව ඇත. 2020.08.28 දිනැති අංක 01/2020 දරන රාජය මුදල් චක්‍ර ලේඛයේ පළමු කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාල රාමුව ඇතුළත පිළිතුරු ලබා දීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

	දිනට අදාළ වාර්තා විගණනකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි	
06	සියලු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත	එකඟ වෙමි. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, අදාල අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සමඟ එක්ව වාහනවල අයිතිය දිස්ත්‍රික් ලේකම් වෙත පවරා ගැනීම සඳහා පියවර ගෙන ඇත. තවත් වාහන 4ක පවරා ගැනීමේ කටයුතු නිම කිරීමට ඇත. වාහනය අයිතිව තිබූ මුල් අමාත්‍යාංශය හෝ දෙපාර්තමේන්තුව මේ වන විට නොපවතින නිසා අදාල කටයුතු කිරීමට කොමිප්ට්‍රෝලර් ජනරල් කාර්යාලය වෙත ඉල්ලීම් කර ඇත.
07	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණනකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි	එකඟ වෙමි. වාහනවල දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණකාධිපති වෙත භාරදීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.
08	සියලු සංචිත වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	සංචිත වාහනවල රාජ්‍ය ලාංඡනය මේ වන විට පින්තාරු කර ඇත.
09	වාහනයක් ගර්හිත වී මාස 8 වඩා අඩු කාලයකදි අපහරණයය කර නොතිබුණි.	එකඟ වෙමි. ඇතැම් ගර්හිත වාහනවල පූර්ණ අයිතිය දිස්ත්‍රික් ලේකම් නමින් නොතිබූ බැවින් එම වාහනවල සත්‍ය හිමිකාර අමාත්‍යාංශය හෝ දෙපාර්තමේන්තු හඳුනා ගැනීමෙන් පසු අයිතිය මාරුකර ගැනීමේ කටයුතු ක්‍රියාත්මක කර ඇත. එලෙස අයිතිය මාරුකරගැනීමෙන් පසු අපහරණය සඳහා පියවර ගෙන ඇත. ඉතිරි ගර්හිත වාහන වල අපහරණය නිම කිරීම සඳහා අවශ්‍ය පියවර ගනිමින් පවතී
10	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	ණය ශේෂ 4ක් යටතේ මුලු එකතුව රුපියල් 520,394/- ක හිඟ ණය ශේෂයක් පැවතුණි. සේවය හැර ගිය නිලධාරී දෙදෙනෙකුගේ (කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත්) විශ්‍රාම ගිය නිලධාරී දෙදෙනෙකුගේ (නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා කින්නියා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ට අයත්) ශේෂ මෙයට අයත් විය. අදාල කාර්යාල මගින් ණය ශේෂ අයකර ගැනීමට අදාල පියවර ගෙන ඇත. කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් නිලධාරි දෙදෙනාගේ ණය අයකර ගැනීමට කාර්යාල මට්ටමෙන් ගතයුතු ක්‍රියාමාර්ග ගත්පසු නීතිමය තටයුතු සඳහා ත්‍රිකුණාමලය ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී වෙත පැමිණිළි කර ඇත. නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ටී. ලිව්ජින් මිය විනය ක්‍රියාමාර්ගයකට යටත් ව සිටින බැවින් ඇගේ ණය ශේෂය වන රුපියල් 187,000/. ක මුදල අයකර ගැනීම විනය නියෝගයෙන් පසුව සිදුකරනු ලැබේ.

		කින්නියා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ට අයත් කේ.එම්.ඒ. සලීම් මහතාගේ විශ්‍රාම වැටුප තවමත් සකස් වී නොමැති අතර ඔහුගේ ශේෂය වන රුපියල් 83,580/= ක මුදල විශ්‍රාම වැටුපෙන් එක්වර අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ
	දෙවන කොටස	
11	මාසික ව දිස්ත්‍රික් සම්බන්ධීකරණය කමුිව රැස්වීම් පවත්වා නොතිබුණි	එකඟ වෙමි. කොවිඩ් 19 වසංගත තත්ත්වය හා 2022 වසර තුල පැවැති අසහනකාරී වාතාවරණය නිසා දිස්ත්‍රික් සම්බන්ධීකරණය කමුිව රැස්වීම් මාසික ව පැවැත්වීමේ කියාවක් නොපැවතුණි. දිස්ත්‍රික් සම්බන්ධීකරණය කමුිව රැස්වීම් මේ වන විට මාසිකව පවත්වනු ලැබේ.
12	දිස්ත්‍රික් මිළ නියම කිරීමමේ කමුිව මාසිකව රැස්වීම් බවත්වා නොතිබුණි.	මෙම රැස්වීම වර්ෂකට දෙවරක් පැවැත්වීම සිදු විය. නමුත්, ඉදිකිරීම් මිල මට්ටම් මාසිකව යාවත්කාලීන කිරීමේ සඳහා නිකුත් කළ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ 2022-03-21 දිනැති ලිපියේ උපදෙස් ප්‍රකාරය එම රැස්වීම කාර්තුමය පදනමින් පැවැත්වීමට පියවර ගෙන ඇත.
13	හදුනාගත් තිරසර අරමුණු ඉටු කර ගැනීම සඳහා ළඟා කර ගත යුතු ඉලක්ක තීරණයය කර නොතිබුණි	ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයට අදාලවන පරිදි තිරසර සංවර්ධන සැලැස්මක් හා ඉලක්ක සකස් කර දෙන ලෙසට ඉල්ලීමක් තිරසර සංවර්ධන කවුන්සිලයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර ඇත. අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු හා වෙනත් පර්ශව මගින් දිස්ත්‍රික්කයට ලැබෙන අරමුදල් අනුව අදාල තිරසර සංවර්ධන ඉලක්ක හදුනාගෙන ක්‍රියාත්මක කරනු ලැබේ
14	හුදුනාගත් තිරසර සාවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක නියම කර නොතිබුණි.	ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයට අදාලවන පරිදි තිරසර සංවර්ධන සැලැස්මක් සකස් කර ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක නියම කර දෙන ලෙසට ඉල්ලීමක් තිරසර සංවර්ධන කවුන්සිලයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර ඇත. තෝරාගත් දර්ශක කිහිපයත් මගින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතිවල ප්‍රගතිය තාවකාලිකව මනිනු ලැබේ
15	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි	එම සැලැස්ම සකසා අනුගමනය කිරීම පිණිස අතිරේක දිස්ත්‍රික් ලේකම් පත්කර ඇත. තවද චක්‍ර ලේඛයේ විධි විධාන වලට අනුගතවීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සිදු කරනු ලැබේ. ප්‍රගති සමාලෝචන රැස්වීම්වලදී පසුවිපරම් කිරීම සිදු කරනු ලැබේ.
16	සමස්ථ කාර්ය මණ්ඩලයට අදාලව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි	කාර්යා සාධන සැලසුම් සකස් කිරීම හා රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා සම්පත් දායකයකුගේ සහාය ලබාගැනීමට කටයුතු කර ඇත. ප්‍රගති සමාලෝචන රැස්වීම්වලදී පසුවිපරම් කිරීම සිදු කරනු ලැබේ.
17	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණයන මතය, යටත්ව මට්ටමේ/	සැලසුම් කළ බොහොමයක් ක්‍රියාකාරකම් සිදු කර ඇත. එසේ වුවද ඇතැම් ක්‍රියාකාකරකම් 2022 වසර තුළ ඇති වූ කොවිඩ් 19 වසංගත තත්ත්වය හා ආර්ථික කඩා වැටීම හමුවේ සැලසුම් කළ පරිදි සිදු කිරීමට නොහැකි විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස පුහුණු වැඩසටහන්

	ව්‍යාචන මට්ටමේ/ අහිතකර මට්ටමේ විය	වැනි ක්‍රියාකාරකම් ක්‍රියාත්මක නොකිරීමේ තත්ත්වයක් පෙන්නුම් කිරීමට ඉඩ ඇත. විගණකාධිපති විසින් වරින් වර පෙන්වා දී ඇති අඩු පාඩු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වලදී හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල ප්‍රගති සමාලෝචන රැස්වීම් වලදී සමාලෝචනය කරනු ලැබේ.
18	හඳුනාගත් සේවා ඉලක්ක සපුරා ගැනීම මැන බැලීම සඳහා ක්‍රමවේදයක් සකස් කර යනොතිබුණි	හඳුනාගත් සේවා ඉලක්ක සපුරා ගැනීම මැන බැලීම සඳහා ක්‍රමවේදයක් සකස් කර ඇති අතර දැනට භාවිතයේ ඇත. සියළු ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් හා දිස්ත්‍රික් කාර්යාලය තම ප්‍රගතිය වාර්තා කරනු ලැබේ.
19	සමාලෝචිත වර්ෂයේ කාර්ය සාධන ඉලක්ක නියමිත දිනට ඉදිරිපත් කර නොමැත	එකඟ වෙමි. නියමිත දිනට කාර්යසාධන ඉලක්ක ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයක් වී ඇත. මෙම අවශ්‍යතාවය සමඟ අනුකූල වීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන ඇත. මේ වන විට කාර්ය සාධන ඉලක්ක නියමිත දිනට ඉදිරිපත් කරනු ලැබේ.
20	හඳුනාගත් කාර්ය සාධන දර්ශක ළඟාකරගැනීම 24%ට වඩා අඩු ප්‍රමාණයන් විය.	2022 වසර තුළ කොවිඩ් වසංගත ව්‍යාප්තිය හා ආර්ථික පසුබෑම හේතුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල නිසි පරිදි විවෘතව නොතිබීම නිසා මහජනයාට සේවා සැපයීම අවම මට්ටමක පැවතුණිමහජනයාට සේවා සැපයීම මේ වන විට 80% කට වැඩි මට්ටමක පවතී
21	සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමා 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	එකඟ වෙමි. 2022 වසර තුල කොවිඩ් වසංගත ව්‍යාප්තිය නිසා නිලධාරීන් රැස්කිරීම අවධානම් සහගත වූ බැවින් හා වියදම් සීමා කිරීම නිසා පුහුණුවීම් පැවැත්වීම ඉතාමත්ම සීමාසහිතවිය.. ප්‍රතිපාදන සීමාවන්ට යටත්ව අවශ්‍ය පුහුණුවීම් ලබාදෙනු ලැබේ.
22	සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	එකඟ වෙමි. සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් ලබා ගැනීම තහවුර කිරීමට අවශ්‍ය කටයුතු දැඩිව ක්‍රියාත්මක කර ඇත.
23	උපරිම සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කිරීමට කටයුතු කර නොතිබුණි.	උපරිම සේවා කාලයක් සම්පූර්ණය කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කිරීමට කටයුතු කර ඇත. මෙය දැනට නිවැරදිව ක්‍රියාත්මක වේ.

.....
චාමින්ද හෙට්ටිආරච්චි
දිසාපති හා දිස්ත්‍රික් ලේකම්
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
ත්‍රිකුණාමලය

චාමින්ද හෙට්ටිආරච්චි
දිසාපති හා දිස්ත්‍රික් ලේකම්
ත්‍රිකුණාමලය

.....
පී. ජෙයබාස්කර්
ප්‍රධාන ගණකාධිකාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
ත්‍රිකුණාමලය

පී. ජෙයබාස්කර්
ප්‍රධාන ගණකාධිකාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
ත්‍රිකුණාමලය

ලේකම්තුමාගේ නිර්දේශය

දිස්ත්‍රික් ලේකම් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග නිර්දේශ කරන අතර පෙන්වා දී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් පෞද්ගලික අවධානය යොමු කරමින් ඒවා නිවැරදි කරන ලෙස දිස්ත්‍රික් ලේකම්ට උපදෙස් ලබා දී ඇත.

ප්‍රදීප් යසරත්න

ලේකම්,

රාජ්‍ය පරිපාලනය,ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා
හා පළාත් පාලන අමාත්‍යාංශය
(ස්වදේශ පරිපාලන අංශය)
"ගිරි මැදුර" ඇල්විටිගල මාවත, කොළඹ 05.

ඇමතිතුමාගේ නිර්දේශය හා ගෙන ඇති ක්‍රියාමාර්ග

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී ඇති උපදෙස් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එම අඩුපාඩු නැවත ඇති නොවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මා විසින් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත උපදෙස් ලබා දී ඇති අතර එම ක්‍රියා මාර්ග 2024 වර්ෂය තුල දී සාධනීය මට්ටම් ප්‍රශස්ත මට්ටමට ළඟා කර ගැනීමට අපේක්ෂා කරමි.

දිනේෂ් ගුණවර්ධන (පා.ම.)

අග්‍රාමාත්‍ය සහ

රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය.